දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය

DISTANCE AND CONTINUING EDUCATION UNIT – UNIVERSITY OF RUHUNA

සාමාන්‍ය ශාස්ත්‍රවේදී උපාධි ප්‍රථම භාග (බාහිර) පරීක්ෂණය

2011 ඔක්තෝබර්/නොවැම්බර්

General Degree Examination in Arts (External) Part I

October/November 2011

# දේවිසා 2.1 - දේශපාලන සමාජ න්‍යාය

# PSG 2.1 - Political and Social Theory

**කාලය පැය තුන යි.**

**ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.**

**(නො පැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කරනු ලැබේ.)**

---

(01) “දේශපාලන න්‍යාය මගින් දේශපාලන චින්තකයා අවබෝධ කරගත් ලෙසට දේශපාලන යථාර්ථය පිළිබඳ ව ආකෘතිමය පැහැදිලි කිරීමක් සිදුකරනු ලැබේ.” විචාරාත්මකව පරීක්ෂා කරන්න.

(02) ප්ලේටෝගේ හෝ ඇරිස්ටෝටල්ගේ දේශපාලන අදහස් නූතනයේ දී අධ්‍යයනය කිරීමේ ඇති වැදගත්කම පැහැදිලි කරන්න.

(03) “ප්ලේටෝගේ සමූහාණ්ඩුව කෘතිය (Republic) ඔහුගේ දේශපාලන අදහස් හා සම්බන්ධ වූ ප්‍රධාන කෘතිය වුවද එය දේශපාලන අදහස්වලට පමණක් සීමා වී නොමැත.” විමසන්න.

(04) “ඇරිස්ටෝටල්ගේ “දේශපාලනය” (Politics) කෘතිය ආණ්ඩු ක්‍රමය හා දේශපාලනය පිළිබඳ ප්‍රායෝගික කෘතියක් වශයෙන් සඳහන් කළ හැකිය.” ඉහත ප්‍රකාශය විචාරාත්මකව පරීක්ෂා කරන්න.

(05) “ක්‍රිස්තියානි ආගම මධ්‍යතන යුගයේ දේශපාලන අදහස් ගොඩනැගීමට බලපෑ ප්‍රධාන සාධකය විය.” විමසන්න.

(06) “මැකියාවෙලීගේ දේශපාලන ප්‍රවේශය ආගමික සහ සදාචාරාත්මක වශයෙන් ස්වාධීන වූ ප්‍රවේශයකි.” සාකච්ඡා කරන්න.

(07). බටහිර දේශපාලන චින්තනයේ වර්ධනය සම්බන්ධව සමාජ සම්මුතිවාදයේ දායකත්වය අගය කරන්න.

(08) පැසිස්ට්වාදය බිහිවීමට තුඩු දුන් හේතු සාධක සාකච්ඡා කර පැසිස්ට්වාදයේ මූලික ලක්ෂණ සාකච්ඡා කරන්න.

(09) මාක්ස්ගේ දේශපාලන චින්තනය තුළ අන්තර්ගත ඓතිහාසික භෞතිකවාදය පිළිබඳ ව විමසීමක් කරන්න.

(10) පහත සඳහන් ඕනෑම දෙකක් පිළිබඳව කෙටි සටහන් ලියන්න.

i. මොන්ටෙස්කියුගේ බලතල බෙදීමේ සිද්ධාන්තය
ii. මාඕ සේතුං
iii. ලිබරල්වාදය
iv. අනධිකාරීවාදය
v. සමාජවාදය